(8)

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
# கூட்டுறவு அபிவிருத்தி திணைக்களம்
# DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT


දුරකථනය / தொலைபேசி / Telephone: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ. 419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ. இல. 419, இல. 330, யூனியன் பிளேஸ், கொழும்பு 02
P.O. Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: dcoopdev@sltnet.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Web: www.coop.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: DCD/6/1/61 | ඔබේ අංකය / உமது இல. / Your No.: | දිනය / திகதி / Date: 2020.02.17

චක්‍රලේඛ අංක:02/2020(ව්‍යවස්ථාපිත)

නියෝජ්‍ය කොමසාරිස්වරුන් සහ
සහකාර කොමසාරිස්වරුන් වෙත

## සමූපකාර සමිතිවල ව්‍යවස්ථාපිත කාර්යන් සඳහා අනුමැතිය ලබා දීම

සමූපකාර සමිති විසින් සමිතිවල පරමාර්ථවලට සම්බන්ධ යම් කාර්යයන් සඳහා ඉඩම් , ගොඩනැගිලි හෝ වෙනත් චංචල හෝ නිශ්චල දේපල මිලදී ගැනීමට හෝ තෑගි වශයෙන් හෝ වෙනත් ආකාරයකින් අත්කර ගැනීමට හෝ බදු වශයෙන් ලබා ගැනීමට හෝ කටයුතු කිරීමේදී සමූපකාර සමිති පනතේ 33 වගන්තිය හා සමූපකාර සමිති රීති මාලාවේ 48(I) සහ (II) රීති යටතේ අනුමැතිය ඉල්ලා සිටින අවස්ථාවන් වලදී පහත දක්වා ඇති අයිතමයන් සඳහා ඒ යටතේ දක්වා ඇති සීමාවන්ට යටත්ව සහකාර කොමසාරිස්වරුන්ට සහ ඔවුන්ගේ වගකීම යටතේ අනුමැතිය ලබා දිය හැකිය. නමුත් මාගේ අනුමැතිය අවශ්‍ය යැයි සිතනු ලබන විශේෂිත අවස්ථාවකදී වටිනාකම නොසලකා මාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සිදු කළ හැකිය.එමෙන්ම ඉඩම්, ගොඩනැගිලි, මිලදි ගැනීම් හා ඉදිරිපත් කිරීම් සඳහාත් යන්ත්‍රෝපකරණ පරිගණක මෘදුකාංග සහ වාහන මිලදී ගැනිම සඳහාත් වන ඉල්ලීම් මාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

02. නිශ්චල හෝ චංචල දේපල මිලදි ගැනීම හෝ අත්පත් කර ගැනිම හෝ බැහැර කිරීම සඳහා අනුමැතිය ලබා දීමේදී සමූපකාර නීතියේ විධිවිධානයන් සපුරා ඇත්ද , මිලදී ගැනිම, අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් සඳහා මිල ගණන් කැඳවීම් විධිමත්ව කාර්ය්‍ය පටිපාටීන් අනුගමනය කරමින් විනිවිද භාවයෙන් යුතුව සිදු කර ඇත්ද යන්න පිළිබඳ සෑහිමකට පත්ව අනුමැතිය ලබා දීමට ක්‍රියා කල යුතු බව අවධාරණය කරමි.

### අනුමැතිය ලබා දීමේ මූල්‍ය සීමාවන්

| මිලදී ගැනීම් | සහකාර කොමසාරිස් | නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් |
|---|---|---|---|
| කාර්යාලිය ගෘහ භාණ්ඩ | 500,000 දක්වා | 750,001-10,00,000 දක්වා | 10,00,001 ට වැඩි |
| කාර්යාලිය උපකරණ | 500,000 දක්වා | 750,001-10,00,000 දක්වා | 10,00,001 ට වැඩි |
| වායු සමීකරණ | 500,000 දක්වා | 10,00,001-15,00,000 දක්වා | 15,00,001 ට වැඩි |
| අලුත් වැඩියා | | | |
| ගොඩනැගිලි | 1000,000 දක්වා | 500,001 සිට 15,00,000 දක්වා | 15,00,001 ට වැඩි |
| වාහන | 500,000 දක්වා | 500,001 සිට 15,00,000 දක්වා | 15,00,001 ට වැඩි |
| වත්කම් බැහැර කිරීම | 500,000 දක්වා | 500,001 සිට 5,00,000 දක්වා | 5,00,001 ට වැඩි |

03. සමූපකාර සමිති අලුතින් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන ලද අවස්ථා වලදී ඒ සම්බන්ධයෙන් වන ඉල්ලීම් ප්‍රථමයෙන් මා වෙත ඉදිරිපත් කරන ලෙසත්

04. සමූපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා සංශෝධනයන් සම්බන්ධයෙන් වන ඉල්ලීම් ලියාපදිංචියට පෙර මාගේ පූර්ව අනුමැතිය ලබා ගන්නා ලෙසත් කාරුණිකව දන්වමි.

සුවින්ද එස්. සිංගප්පුලි
සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්